01) පාඩම හෝ ඒකකය - සංගීත ශිල්පීන් (ජග්ජිත් සිං මහතා)

02) ඉගෙනුම් ඵල -

- ජග්ජිත් සිං මහතාගේ ජීවන තොරතුරු අධ්‍යයනය කරයි.
- ජග්ජිත් සිං මහතාගේ ගායන ශෛලිය නම් කරයි.
- මෙතුමා ලැබූ විරුදාවලිය පිළිබඳ තොරතුරු දක්වයි.
- ජග්ජිත් සිං මහතා ලැබූ සම්මාන නම් කරයි.
- ජග්ජිත් සිං මහතා දැක් වූ දක්ෂතා අගය කරයි.

03) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

- E නැණ පියස සාමාන්‍ය පාඩම් සහ අන්තර්ජාලය උපයෝගී කරගෙන ජග්ජිත් සිං මහතා පිළිබඳ තොරතුරු ගවේශනය කරන්න.
- අන්තර්ජාලය ඔස්සේ එතුමාගේ නිර්මාණය නරඹා රස විඳින්න.

1) ජග්ජිත් සිං මහතාගේ ජීවන තොරතුරු විස්තර කරන්න .

2) ජග්ජිත් සිං මහතා දක්ෂතා දක්වන ක්ෂේත්‍ර මොනවාද ?

3) ජග්ජිත් සිං මහතා ලැබූ විරුදාවලිය පිළිබඳ තොරතුරු දක්වයි.

4) ජග්ජිත් සිං මහතා ලැබූ සම්මාන නම් කරයි.

5) මෙතුමා ගායන ශෛලිය නම් කර අගය කරයි.

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක -

## ජග්ජිත් සිං




සික් ජාතික අමර්සිං සහ බචන් කෞර් යුවළට පුත් ව 1941 පෙබරවාරි මස 08 වන දින ඉන්දියාවේ ශ්‍රී ගංගානගර් හි දී ජග් මෝහන් සිං උපත ලැබී ය. පසු කලෙක ජග්ජිත් සිං ලෙස ඔහු තම නම වෙනස් කර ගත්තේ ය. ගසල් රජු යන විරුදාවලිය ලත් මෙම ශ්‍රේෂ්ඨ සංගීතඥයා විශිෂ්ට ගසල් ගායකයෙක්, ගීත රචකයෙක්, සංගීත නිර්මාණ ශිල්පියෙක්, සංගීත අධ්‍යක්‍ෂ වරයෙක් විය.

තම මූලික අධ්‍යාපනය කල්සා උසස් පාසලෙන් සහ ශ්‍රී ගංගානගර් රජයේ පාසලෙන් ලබාගත් මොහු තම කලා උපාධිය ලබා ගත්තේ ජලන්දර්හි DAV විද්‍යාලයෙනි. අනතුරුව හර්යානාහි කුරුක්ෂේත්‍ර විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධිය ලබා ගත්තේ ය. මොහු පණ්ඩිත් චගන්ලාල් ශර්ම සහ උස්තාද් ජමාල් ඛාන් යන සංගීතඥයන් යටතේ සම්භාව්‍ය ඉන්දියානු සංගීතය හදාරා ගුවන් විදුලිය හා වේදිකාව හරහා තම හැකියාවන් ප්‍රදර්ශනය කරන්නට විය. 1965 වර්ෂයේ දී මොහු මුම්බායි නගරය වෙත යන්නේ බොලිවුඩ් සිනමා කර්මාන්තය නිසා සංගීත කලාවට උදාවී ඇති අවස්ථාවන් සොයමිනි.

මෙහිදී ඔහුට තොණ්ඩය කපා රැවුල බා තම සික්ජාතික පෙනුම වෙනස් කරගන්නට සිදුවිය. ඔහු ප්‍රථමයෙන් ම සුරේෂ් අමින්ගේ ධරති හා චෝරු Dharati Na Chhoru චිත්‍රපටයට රංගනයෙන් දායක වෙමින් බොලිවුඩ් සිනමාවට එක් විය. 1969 වසරේ දී බෙංගාල් ජාතික කාන්තාවක වූ චිත්‍රා දත්ත Chitra Dutta සමග විවාහ විය. ඇය ද දක්ෂ ගසල් ගායිකාවකි. විවේක් ඔවුන්ගේ පුත්‍රයා විය. 1976 දී 'The unforgattable' නමින් තම ප්‍රථම සංගීත ඇල්බමය නිකුත් කිරීම ඔවුන් ලත් විශාල ජයග්‍රහණයක් විය.

ඔහු කුඩා ගීත රචනා සඳහා බටහිර සංගීතය මිශ්‍ර කර සංගීත නිර්මාණය කරමින් ඒවාට ජීවය ලබා දිනි. අනතුරු ව ඔවුන් ලොව පුරා සංචාරය කරමින් සන්දර්ශන පවත්වන්නට වූ අතර ඉන් ලද ජනප්‍රියත්වය නිසා ම 'Ghazal king' යන විරුද නාමය ලැබී ය. මොහු විවිධ භාෂාවන් ගෙන් ගීත ගායනා කොට ඇති අතර ගසල් ගායනයට අමතර ව ශාස්ත්‍රීය ගායනා හා ජන ගායනා සඳහා ද හාමෝනියම් සහ පියානෝ වාදනයට ද දක්‍ෂතාවක් දක්වයි. ඔහුගේ ගීත රචනා රටාව හා ගායන රටාව ඉන්දීය සම්භාව්‍ය සංගීතයේ දී 'Bol Pradhan' ලෙස හැඳින්වෙයි. එනම් වචන අවධාරණය කිරීම යන අදහස යි. දශක 5කට ආසන්න කාලයක් තුළ දී මොහු ගීත ඇල්බම් 80කට පමණ දායක වී ඇත. අගමැති වජ්පායි විසින් රචනා කරන ලද ගීත සඳහා සංගීතය නිර්මාණය කරමින් ගායනා කළ එක ම සංගීතඥයා ද මොහු විය.

2003 වසරේ දී මොහු ඉන්දියානු රජයෙන් පිදෙන 'පද්ම භූෂණ' සම්මානයෙන් ද 2012 වසරේ දී රාජස්ථාන් රත්න සම්මානයෙන් ද පිදුම් ලැබී ය. ඔහුට ගරු කිරීමක් ලෙස ඉන්දියානු රජය විසින් 2014 වසරේ දී තැපැල් මුද්දරයක් ද නිකුත් කරනු ලැබී ය.

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - 10 ශ්‍රේණිය පෙරදිග සංගීතය - https://www.enenapiyasa.lk
- ගුරු ගෙදර - නැත
- වෙනත් - (YouTube) - සොයන්න

05) අතිරේක පොත්/සගරා -

- 10 ශ්‍රේණිය පෙරදිග සංගීතය අතිරේක කියවීම් පොත, සෞන්දර්ය අධ්‍යාපන දෙපාතර්මේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.